# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,481 — 1963 ජනවාරි 18 වැනි සිකුරාදා — 1963. 1. 18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 77 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 81 | අය-වැය ලේඛන ... ... ... | 85 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 84 | දේපළ විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 84 | මාගී කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 85 | විවිධ දැන්වීම් ... ... ... | 85 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඞී.—බී. 69/41

ප. පා. දෙ.—ජීසී. 2/2/3

### ගම්සභා ආඥාපනත

1961යේ අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 (2) වැනි වගන්තිය යටතේ පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිත ආඥාවයි.

එම්. සමරවීර,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා.

1962 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

හලාවත දිස්ත්‍රික්කයේ යගම්පත්තු ගම්සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය, ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියට අදාළ තුන්වැනි අතුරු විධානයේ සඳහන් අක්කර බද්ද පනවා අයකිරීම සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1-582

### 1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපණත

1951 කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපණතේ 13 ඒ "1" දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරී තැනවූ ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්සභාවේ සභාපති වූද, ටී. බ. මු. හේරත් වන මම, 1963 මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන්වන දිනවලදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්සභා ප්‍රදේශ සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම, විකිණීම හෝ මස්කඩ විවෘතකර තැබීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

ටී. බ. මු. හේරත්,
උඩපළාත (නු/එ) ගම්සභාවේ සභාපති.

1963 ජනවාරි මස 1 දින,
රාගල, හල්ග්‍රන්ඔය ගම්සභා කායසීාලයේදීය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1963 ජනවාරි | ... | ... 9, 25 | යන දිනයන් |
| 1963 පෙබරවාරි | ... | ... 8, 23 | එම |
| 1963 මාර්තු | ... | ... 9, 25 | එම |
| 1963 අප්‍රේල් | ... | ... 8, 23 | එම |
| 1963 මැයි | ... | ... 6, 7, 8, 22 | එම |
| 1963 ජූනි | ... | ... 5, 6, 7, 21 | එම |
| 1963 ජූලි | ... | ... 6, 20 | එම |
| 1963 අගෝස්තු | ... | ... 5, 19 | එම |
| 1963 සැප්තැම්බර් | ... | ... 3, 17 | එම |
| 1963 ඔක්තෝබර් | ... | ... 3, 17 | එම |
| 1963 නොවැම්බර් | ... | ... 1, 15, 30 | එම |
| 1963 දෙසැම්බර් | ... | ... 15, 30 | එම |

1–546

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත (272 වන අධිකාරය)**

1951 කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපනතේ 13 නේ "ඒ" 1 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියාවූ ඩී. පී. වික්‍රමසිංහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්සභාවේ සභාපති වන මම, 1963 වර්ෂයේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනවලදී "පිලැස්ස ගම්සභා සීමාව තුළ" මස් පිණිස සතුන් මැරීම හා විකිණීම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1963 ජනවාරි මස | ... | ... | 9, 25 යන දිනයන් |
| 1963 පෙබරවාරි මස | ... | ... | 8, 23 එම |
| 1963 මාර්තු මස | ... | ... | 9, 25 එම |
| 1963 අප්‍රේල් මස | ... | ... | 8, 23 එම |
| 1963 මැයි මස | ... | ... | 6, 7, 8, 22 යන දිනයන් |
| 1963 ජූනි මස | ... | ... | 5, 6, 7, 21 එම |
| 1963 ජූලි මස | ... | ... | 6, 20 එම |
| 1963 අගෝස්තු මස | ... | ... | 5, 19 එම |
| 1963 සැප්තැම්බර් මස | ... | ... | 3, 17 එම |
| 1963 ඔක්තෝබර් මස | ... | ... | 3, 17 එම |
| 1963 නොවැම්බර් මස | ... | ... | 1, 15, 30 එම |
| 1963 දෙසැම්බර් මස | ... | ... | 15, 30 එම |

ඩී. පී. වික්‍රමසිංහ,
පිලැස්ස ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්‍යාලය,
මාවතගම, 1962 දෙසැම්බර් මස 31 වැනි දින.

1–547

---

## ගල්බඩ කෝරලේ ගම්සභාව

**ගෝඝාතක ආඥපනත**

1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 13(ඒ) (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියා වූ ගල්බඩ කෝරලේ ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සභාතිවූද, රාජකරුණා වාසල අතපත්තු මුදියන්සේ රාලහාමිල්ලාගේ සේනාරත්න බණ්ඩා මොල ගොඩ වන මම, 1963 වර්ෂයේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන පුර පසළොස්වක් පොහෝ දිනවලදී ගල්බඩ කෝරලේ ගම්ප්‍රදේශයේ ගම්සභා සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම මෙයින් තහනම් කරමි.

### උප ලේඛනය

| | | |
|---|---|---|
| 1963 ජනවාරි | ... | 9 |
| 1963 පෙබරවාරි | ... | 7 |
| 1963 මාර්තු | ... | 9 |
| 1963 අප්‍රේල් | ... | 8 |
| 1963 මැයි | ... | 7 හා 8 |
| 1963 ජූනි | ... | 6 හා 7 |
| 1963 ජූලි | ... | 6 |
| 1963 අගෝස්තු | ... | 4 |
| 1963 සැප්තැම්බර් | ... | 3 |
| 1963 ඔක්තෝබර් | ... | 31 |
| 1963 නොවැම්බර් | ... | 30 |
| 1963 දෙසැම්බර් | ... | 29 |

ඇස්. බී. මොලගොඩ,
සභාපති තැන,
ගල්බඩ කෝරලේ ගම්සභාව,

ගම්සභා කාර්යාලය,
. මාවනැල්ල,
1963 ජනවාරි මස 4 වැනි දින.

1-650

---

## කොළඹ දිස්ත්‍රික්කයේ හන්වැල්ල පේරුව (ගම් ප්‍රදේශයේ) ගම් සභාව

1951 අංක 2 දරණ පනතින් සංශෝධිත ගෝඝාතක ආඥපනතේ (272 වැනි අධිකාරය) 13 ඒ (1) දරණ වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලය පරිදි, නිසි බලධරයාවූද, හන්වැල්ල පේරුව ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සභාපති වරයාවූද, සුගතන් එදිරිසිංහ වන මම, 1963 වර්ෂය තුළ මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනවලදී හන්වැල්ල පේරුව ගම්ප්‍රදේශයේ ගම්සභාව සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම තහනම් කරමි.

සුගතන් එදිරිසිංහ,
සභාපති.

හන්වැල්ල පේරුව (ගම්ප්‍රදේශයේ) ගම්සභා කාර්‍යාලය,
හන්වැල්ල, 1963 ජනවාරි මස 8 වෙනි දින.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1963 ජනවාරි | ... | ... | 9 |
| 1963 පෙබරවාරි | ... | ... | 4, 7 |
| 1963 මාර්තු | ... | ... | 9 |
| 1963 අප්‍රියෙල් | ... | ... | 8 |
| 1963 මැයි | ... | ... | 7,8 |
| 1963 ජූනි | ... | ... | 6 |
| 1963 ජූලි | ... | ... | 6 |
| 1963 අගෝස්තු | ... | ... | 4 |
| 1963 සැප්තැම්බර් | ... | ... | 3, 26 |
| 1963 ඔක්තෝබර් | ... | ... | 2, 31 |
| 1963 නොවැම්බර් | ... | ... | 30 |
| 1963 දෙසැම්බර් | ... | ... | 29 |

1–638

---

## අළුත්ගම පළාතේ ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

**ගොඝාතක ආඥපනත**

1951කේ අංක 2 දරණ පනතින් සංශොධිත ගොඝාතක ආඥ පනතේ 201 පරිච්ඡේදයේ 13 ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූ ද, අළුත්ගම ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සභාපතිවූ ද, ඒ. ඒ. මහමූද් වන මම, 1963 වර්ෂය තුල මෙහි පහත දක්වන උපලේඛනයේ සඳහන් වන දින වලදී කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්ගම ගම්සභා ප්‍රදේශ සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

1. 1963 ජනවාරි මස 9 වන දින
2. 1963 පෙබරවාරි මස 7 වන දින
3. 1963 මාර්තු මස 9 වන දින
4. 1963 අප්‍රේල් මස 8 වන දින
5. 1963 මැයි මස 7 වන දින සහ 8 වන දින
6. 1963 ජූනි මස 6 වන දින
7. 1963 ජූලි මස 6 වන දින
8. 1963 අගෝස්තු මස 4 වන දින
9. 1963 සැප්තැම්බර් මස 3 වන දින සහ 26 වන දින
10. 1963 ඔක්තෝබර් මස 2 වන දින සහ 31 වන දින
11. 1963 නොවැම්බර් මස 30 වන දින
12. 1963 දෙසැම්බර් මස 29 වන දින

ඒ. ඒ.මහමූද්,
සභාපති.

1963 ජනවාරි මස 7 දින,
අළුත්ගම-යක්කල ගම්සභා කාර්‍යාලයේදීය.

1-604

## වැලිගම නගර සභාව

### ගෝඝාතක ආඥපනත

1951 අංක 2 දරණ පනතින් සංශෝධිත ගෝඝාතක ආඥපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 13 ඒ (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරීතැනවූ ද, වැලිගම නගර සභාවේ සභාපතිතැන වූ ද, හෙන්රි දළුවත්ත වන මම, 1963 වර්ෂය තුළ මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී වැලිගම නගර සභා සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ජනවාරි | ... | ... | 9 |
| පෙබරවාරි | ... | ... | 4, 7 |
| මාර්තු | ... | ... | 9 |
| අප්‍රේල් | ... | ... | 8 |
| මැයි | ... | ... | 7, 8 |
| ජූනි | ... | ... | 6, |
| ජූලි | ... | ... | 6 |
| අගෝස්තු | ... | ... | 4 |
| සැප්තැම්බර් | ... | ... | 3 |
| ඔක්තෝබර් | ... | ... | 2, 31 |
| නොවැම්බර් | ... | ... | 30 |
| දෙසැම්බර් | ... | ... | 29 |

හෙන්රි දළුවත්ත,
සභාපති.

නගර සභා කායර්‍යාලය,
වැලිගම, 1963 ජනවාරි මස 8 වැනි දින.

1–539

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභාව

### ගෝඝාතක ආඥපණත

1951 යේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපණත 13 (ඒ) 1 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම් සභාවේ සභාපතිවූද පී. බී. මැදගොඩ වන මම, 1963 වර්ෂයේ දී මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන්වන දිනයන්හිදී නාරම්මල ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම, විකිණීම හෝ මස් කඩ විවෘතකර තැබීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

පී. බී. මැදගොඩ,
සභාපති.

ගම්සභා කායර්‍යාලයය,
නාරම්මල, 1963 ජනවාරි මස 2 වැනි දින.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1963 ජනවාරි මස | ... | ... | 9, 25 යන දිනයන් |
| 1963 පෙබරවාරි මස | ... | ... | 8, 23 යන දිනයන් |
| 1963 මාර්තු මස | ... | ... | 9, 25 යන දිනයන් |
| 1963 අප්‍රියෙල් මස | ... | ... | 8, 23 යන දිනයන් |
| 1963 මැයි මස | ... | ... | 6, 7, 8, 22 යන දිනයන් |
| 1963 ජූනි මස | ... | ... | 5, 6, 7, 21 යන දිනයන් |
| 1963 ජූලි මස | ... | ... | 6, 20 යන දිනයන් |
| 1963 අගෝස්තු මස | ... | ... | 5, 19 යන දිනයන් |
| 1963 සැප්තැම්බර් මස | ... | ... | 3, 17, 26 යන දිනයන් |
| 1963 ඔක්තෝබර් මස | ... | ... | 3, 17 යන දිනයන් |
| 1963 නොවැම්බර් මස | ... | ... | 1, 15, 30 යන දිනයන් |
| 1963 දෙසැම්බර් මස | ... | ... | 15, 30 යන දිනයන් |

1–498

---

## කැකිරාව උප නගර සභාව

### 1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපණත

1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපණතේ 13 (ඒ) (1) දරණ වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියාවූ, කැකිරාව උප නගර සභාවේ සභාපති ජී. ඩී. ඩේවිඩ වන මම, 1963 වර්ෂයේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන පුර පසලොස්වක් පොහෝ දිනවලදී කැකිරාව උප නගර සභා සීමාව තුළදී මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1963 ජනවාරි | ... | ... | 9 |
| 1963 පෙබරවාරි | ... | ... | 7 |
| 1963 මාර්තු | ... | ... | 9 |
| 1963 අප්‍රේල් | ... | ... | 8 |
| 1963 මැයි | ... | ... | 7–8 |
| 1963 ජූනි | ... | ... | 6–7 |
| 1963 ජූලි | ... | ... | 6 |
| 1963 අගෝස්තු | ... | ... | 4 |
| 1963 සැප්තැම්බර් | ... | ... | 3 |
| 1963 ඔක්තෝබර් | ... | ... | 2, 31 |
| 1963 නොවැම්බර් | ... | ... | 30 |
| 1963 දෙසැම්බර් | ... | ... | 29 |

ජී. ඩී. ඩේවිඩ,
සභාපති.

1963 ජනවාරි මස 7 වෙනි දින,
කැකිරාව උප නගර සභා කායර්‍යාලයේදීය.

1–508

---

## කොස්ගොඩ ගම්සභාව

ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම්සභාව විසින් වෂී 1962 දෙසැම්බර් මස 8 වෙනි දින පවත්වන ලද ගම්සභාව මාසික රැස්වීමේදී මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඇම්. සේනානායක,
කොස්ගොඩ ගම්සභාවේ සභාපති නැත.

ගම්සභා කායර්‍යාලය,
අහුන්ගල්ල, 1962.12.13.

### යෝජනාව

"කොස්ගොඩ ගම්සභා සීමාව තුළ පිහිටි මහාජනයා පොදු වශයෙන් පාවිච්චි කරන මෙදින සභා රැස්වීමට ඉදිරිපත් කරන ලිං මින් ඉදිරියට කොස්ගොඩ ගම්සභාව සතු බව ප්‍රදේශයේ මහජනයාට දැනගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ පළකරවා ගැනීම සුදුසුයයි ඇස්. සලමන් ද සිල්වා මහතා විසින් කරන ලද යෝජනාව ටී. ජී. මැන්දිස් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය".

| අංකය | | කොට්ඨාශ අංකය | | ලිඳේ නම |
|---|---|---|---|---|
| 1 | ... | අංක 1 දූවෙමෝදර | ... | පංසලපහල ලිඳ |
| 2 | ... | එම | ... | පුංචමළකන්ද ලිඳ (පොල් වත්ත පාර අද්දර) |
| 3 | ... | එම | ... | දූවෙබැද්ද ලිඳ |
| 4 | ... | එම | ... | බිබිලකුඹුර අද්දර ලිඳ |
| 5 | ... | එම | .... | එගොඩදූව ලිඳ |
| 6 | ... | එම | ... | කනත්ත ලිඳ |
| 7 | ... | අංක 2 නාපෙ 1 | ... | වලව්වත්ත ලිඳ |
| 8 | ... | එම | ... | ගනේගොඩැල්ල පංසල පහල ලිඳ |
| 9 | ... | එම | ... | මහවත්තේ මිල්ටෙරි ලිඳ |
| 10 | ... | අංක 3 නාපෙ 2 | ... | අටවලකුඹුරේ ලිඳ |
| 11 | ... | අංක 3 නාපෙ 2 | ... | අගලකැපූවත්තේ ලිඳ |
| 12 | ... | එම | ... | සිරිමල් ලියනවත්තේ ලිඳ |
| 13 | ... | එම | ... | ලැලිහේත්තුව ලිඳ |
| 14 | ... | එම | ... | බටලන්ද පාර අද්දර ලිඳ |
| 15 | ... | අංක 4 නාපෙ 3 | ... | කිරිමැටිහක්ක ලිඳ |
| 16 | ... | එම | ... | මෙලෙක්වෙල ලිඳ |
| 17 | ... | එම | ... | පැලෑගස්පලාත ලිඳ |
| 18 | ... | එම | ... | නාපෙකන්ද පහල ලිඳ |
| 19 | ... | අංක 5 හැගල්ල 1 | ... | බකිනිගහ ලියැද්ද ලිඳ |
| 20 | ... | එම | ... | මහ ලිඳ |
| 21 | ... | අංක 6 හැගල්ල 2 | ... | අමුනුකන්ද ලිඳ – |
| 22 | ... | එම | ... | හැගල්ල ලිඳ |
| 23 | ... | අංක 7 අහුන්ගල්ල | ... | එගොඩමුල්ල ලිඳ |
| 24 | ... | එම | ... | කෝපිවත්ත ලිඳ |
| 25 | ... | අංක 9 බ්‍රාහ්මනවතුගොඩ | ... | පාතෙගම ලිඳ |
| 26 | ... | එම | ... | පන්නල ලිඳ |
| 27 | ... | එම | ... | දිනිගල්ගොඩ ලිඳ |
| 28 | ... | අංක 10 මහලදූව | ... | ඇල්. බී. බාර්ලිස් සිල්වාට අයිති ප්‍රසිඬ නාන ලිඳ |
| 29 | ... | එම | ... | කේ. ඇම්. මෙරිනෝනාට අයිති ප්‍රසිඬ නාන ලිඳ |
| 30 | ... | අංක 12 ගල්වෙහෙර උතුර | ... | මුංවත්ත ලිඳ |
| 31 | ... | එම | ... | කදලපිටිය ලිඳ |
| 32 | ... | අංක 13 ගල්වෙහෙර දකුණ | ... | වලේකෝවිල ලිඳ |
| 33 | ... | එම | ... | මහවලව්ව වත්තෙ ලිඳ |
| 34 | ... | අංක 14 පොල්අතුපලාත | ... | ගල්ලිඳ |

1-534/1

## කොස්ගොඩ ගමසභාව

ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගමසභාව විසින් වර්ෂ 1962ක්වූ දෙසැම්බර් මස 8 වෙනි දින පවත්වන ලද ගමසභා මාසික රැස්වීමේදී මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඇම්. සේනානායක,
කොස්ගොඩ ගමසභාවේ සභාපති තැන.

ගමසභා කාර්‍යාලය,
අහුන්ගල්ල, 1962.12.13.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගමසභාව විසින් 1959 නොවැම්බර් 27 වෙනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වන කාණ්ඩයේ 1 වැනි වගන්තියේ ප්‍රකාර මෙහි පහත සඳහන් පාරවල් එකිනෙක ඉදිරියේ සඳහන් නියම දිග සහ පළල අනුව එකී අඩි පාරවල් සාද හෝ නැවත සාද හෝ පවත්වාගෙන යා යුතුයයි ද මෙයින් යෝජනා කරනු ලැබේ.

| අංකය | පාරේ නම සහ විස්තර | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| | **අංක 1—දූවේමෝදර කොට්ඨාශය** | | |
| 1 | බෙලිගහ හන්දිය පාරේ සිට කිරිගමුල්ල පාර දක්වා ඩාලින් පෙරේරා රාජකරුණා මහතාට අයිති ඉඩම උඩින් වැටී ඇති අඩිපාර | 420 | 8 |
| 2 | බෙලිගහ හන්දිය පාරේ සිට දුම්රිය පාරට නැගෙනහිරින් පොල්වත්ත දක්වා වැටී ඇති අඩි පාර | 2,640 | 8 |
| 3 | බෙලිගහ හන්දිය පාරේ සිට දූවේමෝදර පොදු නානලිඳ අසලින් මෙහි අංක දෙකෙන් විස්තර කර ඇති පාරට සම්බන්ධවන අඩි පාර | 524 | 8 |
| 4 | එගොඩදූව පාරේ සිට කුරුඳුවත්ත කැලේ මැදින් බිබිලකුඹුර දක්වා වැටී ඇති අඩි පාර | 660 | 6 |
| 5 | එගොඩදූව පාරේ සිට කනත්ත දක්වා වැටී ඇති අඩි පාර | 564 | 8 |
| | **අංක 2—නා පෙ. 1** | | |
| 1 | වඩුවන්කඩ පාර | 300 | 3 |
| 2 | හෙන්විගෙවත්ත පාර | 500 | 3 |
| 3 | වැල්ල පාර | 150 | 3 |
| 4 | පන්සල පාර | 250 | 3 |
| 5 | ගහකෝවිල පාර | 300 | 8 |
| 6 | ගොඩගම පාර | 300 | 3 |
| 7 | හරස් පාර | 150 | 3 |
| | **අංක 3—නාපෙ 2** | | |
| 1 | කොස්ගොඩ කෝවිල පාර | 1,300 | 6 |
| 2 | ගොඩගම පාරේ සිට මහපිටිය පාර දක්වා වැටී ඇති ගොඩගම හරස් පාර | 2,350 | 8 |
| | **අංක 4—නාපෙ 3** | | |
| 1 | සාදගෙදර තොටුපල පාර | 1,300 | 8 |
| 2 | කවිරත්න ගෙදර කෝවිල පාර | 1,400 | 8 |
| | **අංක 5—හැගල්ල 1** | | |
| 1 | වත්මය පාලම හරහා පාර | 1,320 | 6 |
| 2 | පියුම් පාර | 1,240 | 6 |
| 3 | බකිනිගහ ලියැද්ද පාර | 620 | 10 |
| | **අංක 6—හැගල්ල 2** | | |
| 1 | ගොඩ අමුන පාර | 1,320 | 10 |
| 2 | හැගල්ලේ සිට පිටියගොඩ පාරට වැටෙන පාර | — | — |
| | **අංක 7—අහුංගල්ල 1** | | |
| 1 | රාජපක්ෂ විද්‍යාල පාරේ සිට වැල්ල දක්වා පාර | 2,640 | 12 |
| | **අංක 9—බ්‍රාහ්මනවතුගොඩ** | | |
| 1 | දිනිගල්ගොඩ–පාතෙගම්ගොඩ–අම්පෙ පාර | 2,640 | 8 |
| 2 | වැලිවතුගොඩ හරස් පාර | 1,324 | 8 |
| 3 | ඩී. බී. ද සිල්වා මහතාගේ ඉඩම හරහා පාර | 854 | 10 |
| | **අංක 10—මහලදූව** | | |
| 1 | කොන්නරාදූව පාර | 264 | 3 |
| | **අංක 11—මාදූව** | | |
| 1 | වයිරාමග පාර | 2,640 | 6 |
| 2 | පැලකැටිය පාර | 2,640 | 6 |
| 3 | උඩුකර හරස් පාර | 400 | 6 |
| | **අංක 12—ගල්වෙහෙර උතුර** | | |
| 1 | වැලිකන්ද හරස් පාර | 1,324 | 8 |
| 2 | කඳලපිටියේ සිට බෝගහපිටිය දක්වා ඇති පාර | 1,320 | 4 |
| 3 | මැටිල්ල හරහා පාර | 2,120 | 8 |
| 4 | කිරිල්ල ඇල හරහා පාර | 1,320 | 8 |
| 5 | බෝගහපිටිය සිට වැලිකන්ද පාරට වැටෙන පාර | 2,640 | 6 |
| | **අංක 13—ගල්වෙහෙර දකුණ** | | |
| 1 | ගල්වෙහෙර ගල්පොත්ත පාර | 1,300 | 8 |
| 2 | මරදන වෙලේ.පංසල පාර | 1,320 | 8 |
| 3 | මරදන මාකුඹුර පාර | 2,320 | 8 |
| 4 | මහගෙදර වේරගල්තොටුපල පාර | 2,640 | 10 |
| 5 | මුතුවෙල කුඹුර හරහා පාර | 400 | 10 |
| 6 | ගල්වෙහෙර–අම්පෙ පාරේ සිට මහවලව්ව වත්ත මැදින් මහගෙදර–වේරහල් කොටුපල පාර දක්වා වැටී ඇති පාර | 1,320 | 8 |

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසාන යේදී තනතුරුවලට ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී.

සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාලපරිච්ඡේදයක් ඇතුළත දී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අවම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරු වනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් සවකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම් ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතු ය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂක යාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීම කට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොර තුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට සාරානු කූලව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකාබලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඈමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල-දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාල වෙනම් වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :
අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකමං හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයන් සමග—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4 | | | 4. | | |
| 5. | | | 5. | | |

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දින යත් හා අස්වූ දිනයත් දක්වමින් ඇරු තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ සථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු, පළාත් පාලනායතන හා කාල සීමාවන්) :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුනු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම් :—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### පශු වෛද්‍ය තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට මහනුවර නාගරික සභාවට පත්කරනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 4,080—12×360 සහ 5×480—රු. 10,800.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස—1963 පෙබරවාරි මස 5 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිධාරීන් විය යුත්තාහ. ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 8,400 යන වාර්ෂික වැටුප් පෙත්ත ඉක්මවා යාමට සුදුසුකම් ඇතිවීම පිණිස, පත් කරගනු ලබන තැනැත්තා පිළිගත් පශු වෛද්‍ය ආයතනයක පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පශ්චාත් උපාධි පුහුණුවක් ලැබිය යුතුයි.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරු ඔහුගේ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ පෙත්තක් මුඩ තබනු ලැබේ.

4. තෝරාගනු ලබන අයදුම්කරුට පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැත. තවද, ඔහු සේවයෙහි යෙදී සිටින ප්‍රාදේශීය බලමංඩලයේ සීමාව තුළ පදිංචි වන ලෙස ඔහුට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1963 පෙබරවාරි මස 5 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 7 වැනි කොටුවේ පහත දැක්වෙන පරිදි යොදාගත යුතුයි :—

"7. අධ්‍යාපන සහ වෘත්තීය පිළිබඳ සුදුසුකම් :—
(සහතිකවල පිටපත් ඈමිණිය යුතුයි)."

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින 7ක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේ ය.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ, 1963 ජනවාරි මස 12 වැනි දින.

1-673

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

**හතරවැනි ශ්‍රේණියේ පළාත් පාලන ලේකම්වරුන්ගේ සේවයට**

**බඳවා ගැනීමේ විභාගය—1963**

ඉහත සඳහන් විභාගය සඳහා අයදුම්පත් කැඳවමින් 1962.12.14 වැනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සිව්වැනි කොටසේ පළ කළ නිවේදනයට වැඩිදුරටත් ය.

ප්‍රථමයෙන් නිවේදනය කළ පරිදි යථෝක්ත විභාගය 1963 මාර්තු 16 වැනිදා නොව 1963 මාර්තු 23 වැනි දින පවත්වන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1963 ජනවාරි 10 දින,
තැ. පෙ. 530, කොළඹ.

1-583

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඞී.—ඞී. 9/47
ප. පා. දෙ.—ජී 2/281

### ගම්සභා ආඥාපනත

1961කේ අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරළේ හෙළ පල්ල පළාත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වි. චා. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්තැන.

1963 ජනවාරි මස 4 වැනි දින,
කොළඹදීය.

**අතුරු ව්‍යවස්ථා**

1. ගම්සභාව විසින් පිළිගන්නා ලද අශූචි ඉවත්කිරීම සහ කසළ ශෝධනය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කොටසෙහි 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්‍ය සඳහා ගම්සභාව වෙත ගෙවියයුතු අශූචි ඉවත්කිරීමේ මාසික ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල බැගින් විය යුතුය.

2. ගම්සභාව විසින් පිළිගන්නා ලද අශූචි ඉවත්කිරීම සහ කසළ ශෝධනය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කොටසෙහි 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්‍යය සඳහා ගම්සභාව වෙත ගෙවියයුතු මාසික ගාස්තුව ශත විසිපහ බැගින් වියයුතුය.

### ආහාර ද්‍රව්‍ය විකිණීම

3. ගම්සභාව විසින් පිළිගෙන තිබෙන සම්මත අතුරු ව්‍යවස්ථාවල 13 වැනි කොටසෙහි අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 1 වැනි හා 3 වැනි අතුරු ව්‍යවස්ථාවල "මාළු" යන වචනය යෙදෙන හැමවිටම ඒ වෙනුවට "මාළු, හාල්, කුළු බඩු, එළවළු" යන වචන ආදේශ කිරීමෙන් හා,

(2) 2 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි—

(අ) "මාළු, එළවළු," යන වචන වෙනුවට, "මාළු, හාල්, කුළු බඩු, එළවළු" යන වචන ආදේශ කිරීමෙන් හා,

(ආ) "එළවළු හැර" යන වචන වෙනුවට, "හාල්, කුළු බඩු හා එළවළු හැර" යන වචන ආදේශ කිරීමෙන්.

4. මේ අතුරු ව්‍යවස්ථාවල "ගම්සභාව" යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරළේ හෙළ පල්ල පළාත ගම්ප්‍රදේශයේ ගම්සභාව අදහස් කරනු ලැබේ.

1-573

---

ඇල්.ඞී.—ඞී 56/46.
ප. පා. දෙ.—ජී 2/162

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා කෙරෙහි පැවරී තිබෙන බලතල ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වි. චා. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1963 ජනවාරි මස 4 වැනි දින,
කොළඹදීය.

**අතුරු ව්‍යවස්ථා**

### ගොඩනැගිලි හා මායිම් තාප්ප

1. යම් තැනැත්තකු විසින් ගම් ප්‍රදේශය ඇතුළත—

(අ) යම්කිසි ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි දහඅටක හෝ

(ආ) කල්යාමේදී ගම්බද කරත්ත පාරක් බවට පරිවර්තනය කරනු ලබන පටු පාරක් ලෙස සභාව විසින් ප්‍රකාශ කොට ඇති යම්කිසි ගම්බද පටු පාරක් මැද සිට අඩි දාහතරක හෝ

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් කරනලද පටු පාරක් නොවන යම් ගම්බද පටු පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත යම්කිසි ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදීම නොකළ යුතුය.

2. යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් වූ ඇන්වීමකින් යටත් පිරිසෙයින් දවස් තිහකට කලින් වත් ඒ පිළිබඳව සභාපති තුමා වෙත දැනුම් නොදී, 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම්කිසි කරත්ත පාරක් හෝ පටු පාරක් අයිනේ යම්කිසි ගොඩනැගිල්ලක් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම් ප්‍රදේශය ඇතුළත සෑදීම නො කළ යුතුය.

### නිලධරයන් හා සේවකයන්

3. ගම්සභාවට ගෙවිය යුතු සියලුම අයබදු හා ගාස්තු එකතුකොට සභාවේ මුද්‍රාව හා සභාපතිතුමාගේ අත්සනේ නිවැරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස සභාපති විසින් සභාවේ යම් නිලධරයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

4. යම් තැනැත්තකු විසින්—

(අ) ගම්සභා ආඥාපනතේ හෝ ඒ ආඥාපනත යටතේ සාදනලද යම් අතුරු ව්‍යවස්ථාවල යම් විධිවිධානවලින් හෝ ඒ විධිවිධාන යටතේ සභාපති වෙත හෝ ගම්සභාවේ වෙන යම් නිලධරයකු වෙත පැවරී ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉෂ්ටකිරීමේදී හෝ භාර කොට ඇති යම් කාර්‍යයක් ක්‍රියාවේ යෙදවීමේදී ඒ සභාපතිට හෝ නිලධරයාට නැතහොත්

(ආ) ගම්සභාව විසින් හෝ ගම්සභාව වෙනුවෙන් සේවයෙහි යොදවනු ලැබූ යම් සේවකයකුට හෝ කම්කරුවකුට, සභාපති විසින් හෝ ගම්සභාවේ වෙන යම් නිලධරයකු විසින් නීත්‍යනුකූලව පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ටකිරීමේදී ඒ සේවකයාට හෝ කම්කරුවාට, බාධා නො කළ යුතු ය.

**අර්ථ**

5. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් ගම්සභාවේ සභාපති අදහස් කෙරේ.

"ගම්සභාව" යනුවෙන් බෙලිඅත්ත ගම්ප්‍රදේශයේ ගම්සභාව අදහස් කෙරේ.

"ගම්ප්‍රදේශය" යනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ගම්ප්‍රදේශය අදහස් කෙරේ.

1-574

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි පරිච්ඡේදය)

ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි පරිච්ඡේදය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නාම සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ආර්. බයස් අබේසිංහ,
වැඩ බලන (ප්‍රාදේශික බලමණ්ඩල) මැතිවරණ කොමසාරිස්,

1963 ජනවාරි 11 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | ගාළු දිස්ත්‍රික්කය |
| | | හිනිදුම ගම්සභාව |
| 7 | ... | ආරියසිංහ සෙනෙවිරත්න |
| 12 | ... | ඇඹිලගෙදර ගමගේ අර්නෝලිස් |

1-656

## ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි පරිච්ඡේදය)

ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි පරිච්ඡේදය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නාම සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ආර්. බයස් අබේසිංහ,
වැඩබලන (ප්‍රාදේශික බලමණ්ඩල) මැතිවරණ කොමසාරිස්.

1963 ජනවාරි 11 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | රත්නපුර දිස්ත්‍රික්කය |
| | | කුකුල් කෝරළේ මැදපත්තු ගම්සභාව |
| 6 | ... | සමරසිංහ ආරච්චිල්ලාගේ ජයවර්ධන |
| | | කෑගල්ල දිස්ත්‍රික්කය |
| | | දෙහිගම්පල් කෝරළේ සහ පාතබුලත්ගම ගම් සභාව |
| 3 | ... | කන්කානම් මොහොට්ටාල්ලාගේ විජේරත්න |

1-655

# අය–වැය ලේඛන

## බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව

### 1963නේ අය–වැය ලේඛනය

අංක 13,452 සහ 28. 12. 62 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ පළ වූ මෙම පළාත් ආණ්ඩු සභාවේ 1963නේ අය වැය ලේඛනයෙහි සඳහන් අංක යටතේ දක්වෙන වැය ශීර්ෂ වැරදි ලෙස මුද්‍රණය වී ඇති බැවින් එය පහත දක්වෙන පරිදි සංශෝධනය විය යුතුය.

| වැය ශීර්ෂ | | | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්— | | | |
| (1) නිලධාරි වැටුප්— | | | |
| (ඒ) ලේකම්ගේ වේතන | ... | ... | 3,306 50 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව— | | | |
| (5) ජල සම්පාදනය— | | | |
| (අයි) ජීවනාධාර | ... | ... | 2,178 48 |

සී. ඇස්. රත්වත්තෙ,
බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

පළාත් ආණ්ඩු සභාව,
බලන්ගොඩ. 4. 1. 63.

1-590

# විවිධ දැන්වීම්

## කුරුණෑගල මහා නගර සභාව

### පිස්සු බලු රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥා පනතේ 11 (1) වැනි වගන්තිය ප්‍රකාර (476 වැනි පරිච්ඡේදය) කුරුණෑගල නාගරික සහා පාලන සීමාව ඇතුළත පිහිටි, කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක්, ගෙවත්තක් නොවන කිසියම් ස්ථානයක, සිටින නොබඳින ලද හෝ දක්කාගෙන නොයන ලද කිසියම් බල්ලකු, මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලය ලත් යම්කිසි පුද්ගලයකු විසින්, එවේලෙහිම විනාශ කර දමනු ලැබේ.

මෙම ප්‍රකාශනය, 1963 පෙබරවාරි මස 11 වැනි දින සිට මාස හයක් වලංගු වන්නේ ය.

අර්ල් ද අල්විස්,
නාගරික කොමසාරිස් තැන,
කුරුණෑගල පළාත් පාලන ආයතනය.

නගර සභා කායභීලය,
කුරුණෑගල, 1963 ජනවාරි මස 4 වැනි දින.

1-503

## වැලිගම නගර සභාව

### පිස්සු බලු උවදුර

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (333 වන පරිච්ඡේදයේ) පිස්සු බලු උවදුර පිළිබඳ ආඥාපනතේ 11 වන ඡේදයේ ප්‍රකාර වැලිගම නගර සභා සීමාව තුළ පිස්සු බලු උවදුර පැතිර පවත්නා බව මෙයින් නිවේදනය කරමි.

වැලිගම නගර සභා සීමාව තුළ ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ පෞද්ගලික ස්ථානයක් නොවන ඕනෑම ස්ථානයක මිදුලක හෝ ඉඩමක නිසියාකාර නොබඳින ලද එසේ නොමැති නම් භාරකරුවකු නොමැති බල්ලෙකු හෝ බැල්ලියක දුටු වහාම, මාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම අයකු විසින් මරා දැමීමට බලය තිබෙන බව මෙයින් දැනුම් දෙමි.

තවද මෙම දැන්වීම මෙදින සිට 1963.6.30 වැනි දින තෙක් වලංගු වනු ඇත.

හෙන්රි දළුවත්ත,
සභාපති.

නගර සභා කායභීලය ය,
වැලිගම, 1963 ජනවාරි මස 8 වැනි දින.

1-540

## කඳාන සුළු නගර සභාව

### 1962 වර්ෂයේ වරිපනම් ලේඛනය

1962 වර්ෂය සඳහා කඳාන සුළු නගර සභාවේ වරිපනම් ලේඛන සූදානම් බවත්, කාර්යාලීය වේලාවන් තුළදී ඒවා පරීක්ෂාකළ හැකි බවත් නගර සභා ආඥාපනතේ (252 වෙනි අධිකාරියේ) 235 (1) කාණ්ඩය හා සම්බන්ධවූ සුළු නගර සභා ආඥා පණතේ (256 වෙනි අධිකාරියේ) 165 දරණ කාණ්ඩය යටතේ මෙයින් දන්වා සිටිමි.

ඩී. ජී. ඩී. ගුණසේකර,
සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
කඳාන, 1962 ඔක්තෝබර් මස 2 වැනි දින.

1-580

---

## යටකලන්පත්තු ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර කරන උපලේඛනයේ සඳහන් අයවළුන් විසින් එම උපලේඛනයේ දක්වෙන ස්ථානවල 1963 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලවා අයදුම්පතක් මා වෙත එවා තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම් ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 172 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| කේ. තෝමස් ප්‍රනාන්දු ... | ... හරක් මස්, එළු මස් සහ ඌරු මස් | ... මහවැව |

ඒ. වික්‍රමආරච්චි,
යටකලන්පත්තු ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
හත්තිනිය, මාරාවිල.
1962 දෙසැම්බර් මස 27 වැනි දින.

1–609

---

## කොළඹ දිස්ත්‍රික්කයේ මාපිටිගම ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1963 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කොළඹ දිස්ත්‍රික්කයේ මාපිටිගම ගම්සභා ප්‍රදේශයේ ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7 දරණ 1947 තේ අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනතේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇල්. ඇම්. නූර්දීන් ... | ... එළ හරක් මස් ... | ... මල්වාන, නාරංගස්කොටුව ඉඩමේ මිට්ටේ මස්කඩය සඳහා වූ ගොඩනැගිල්ල |

නීල් අමරසේකර,
මාපිටිගම ගම් සභාවේ ප්‍රධාන තැන.

ගම්සභා කාර්යාලය,
තිත්තපත්තර, ගම්පහ හරහා,
1963 ජනවාරි මස 8 වැනි දින.

1–549

---

## කන්දපල්ල කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් 1963 වර්ෂයට හරක් මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට කන්ද පල්ල කෝරළේ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුළත මා වෙත ලියා දැන්විය හැකි බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අ. වණසිංහ,
සභාපති තැන.

කන්දපල්ල කෝරළේ ගම්සභා කාර්යාලය,
ගලේවෙල,
1962 දෙසැම්බර් මස 27 වැනි දින.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුවාගේ නම සහ ලිපිනය | ස්ථානය |
|---|---|---|
| 1. | අයි. ජේ. හම්සා ලෙබ්බෙ, දේවහුව මුස්ලිම් කොළණිය, දේවහුව | ... මුස්ලිම් කොළණිය, දේවහුව |
| 2. | මානා අබ්දුල් මජීදු, රන්වැඩියාව ... ... | ... කෝසන්පිටියේවත්ත, රන්වැඩියාව |
| 3. | ඊ. බදූර්දීන්, නබඩගහවත්ත ... ... ... | ... ඉහිනිගහමුලවත්ත, නබඩගහවත්ත |

1–588

## පන්නල ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයන්හි 1963 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත්‍ර මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරන සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන පන්නල ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා පදිංචිය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. කේ. ඒ. වෙන්සල් අප්පුහාමි | යක්විල ගව මස් විකිණීම |
| 2. ඒ. ආර්. අබ්දුල් වහාබ් | පන්නල ගව මස් විකිණීම |
| 3. ඒ. ආබ්දීන් | බම්මන්න ගව මස් විකිණීම |
| 4. එම්. ඒ. සලීම් | ඇලබඩගම ගව මස් විකිණීම |

ආර්. කේ. ඇස්. රණවීර,
පන්නල ගම්සභාපති.

පන්නල ගම්සභාව,
යක්විල, 1963 ජනවාරි මස 1 වැනි දින.

1-510

---

## හාරිස්පත්තු පල්ලේ ගම්පහ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1963 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව හාරිස්පත්තුවේ පල්ලේ ගම්පහ ගම්ප්‍රදේශයේ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒගැන විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් 1947 අංක 44 දරණ ආඥාපණතේ 6 වැනි වගන්තියෙන් සංශොධිතවූ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

බී. පී. නන්දසේන,
සභාපති,
හා. ප. පල්ලේගම්පහ ගම්සභාව.

වැකඩහදිරම,
පූජාපිටිය, 1963 ජනවාරි මස 3 වැනි දින.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| වී. ඇම්. පරීඩ් ... | හරක්මස් වෙළඳාම ... | බීරිහෙල, ගල්හින්න. |

1-506

---

## ඕතර පලාත ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත විස්තර කරණ උපලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ දැක්වෙන ස්ථානයන්හි 1963 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම් පත්‍ර මා වෙත එවා තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීමට විරුඩව හලාවත දිස්ත්‍රික්කයේ ඕතර පලාත ගම් ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඩවන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනසිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිචෙඡදියේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධනයවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| 1. වර්ණකුලසූරිය පාලකුච්චිගේ ඔස්වින් ප්‍රනාන්දු | වෙලේ කොටුව, හාල්දඹුවන. |
| 2. ත්‍රිමාන්න හෙට්ටිගේ ජුසේ පෙරේරා | මාරාගහ වත්ත, ගෝනාවිල |
| 3. දම්මන ආරච්චිගේ දොන් බෙනඩික් | අංක 6 හරක්මස් කඩය, පොදු වෙළඳ සැල, දන්කොටුව |
| 4. අන්දරේගේ දොන් ජෝසප් අප්පුහාමි | අංක 7, එලුමස් කඩය, පොදු වෙළඳසැල, දන්කොටුව |
| 5. අන්දරේගේ දොන් ජෝසප් අප්පුහාමි | අංක 8, ඌරුමස් කඩය, පොදු වෙළඳසැල, දන්කොටුව |
| 6. වෙළඳගේ ලියෝ රිචඩ් ... | ගම්සභා මස්කඩය, ලුණුවිල |

ඒ. ඇස්. ගුණසේකර,
සභාපතිතැන.

ඕතර පලාත ගම්සභා කායර්ාලය,
දන්කොටුව, 1963 ජනවාරි මස 5 වැනි දින.

1-486

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1963 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡෙදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇම්. මජීදු ... | එළුමස් හා හරක්මස් ... | ඒදණ්ඩවෙල, වැවගම |
| ඊ. ඇල්. ඒ. වහබ ... | එළුමස් හා හරක්මස් ... | ඒදණ්ඩවෙල, වැවගම |

ඒ. ගුණසේකර,
සභාපතිණිය.

ගම්සභා කාර්යාලය,
මුරුතැන්ගේ, නක්කවත්ත,
1963 ජනවාරි මස 7 වැනි දින.

1-548

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්චේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි